## ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - 2014

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 2 (1) උප වගන්තිය අනුව සහ 1974 අගෝස්තු 14 දිනැති හා 124/6 දරන අති විශේෂ ගැසට් පත්‍රය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

පහත සඳහන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ප්‍රකාරව වාර්තාකරණ දිනයෙන් පසුව මාස 12 ක් ඇතුලත නිරවුල් වන වත්කම් ජංගම වත්කම් ලෙසත් අනෙකුත් සියළුම වත්කම් ජංගම නොවන වත්කම් ලෙසත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු වුවද, වර්ෂ 01-15 දක්වා කාලයක් තුල නිරවුල් වන මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට ලබාදී තිබූ රු.17,843,909 ක් වූ කාර්ය මණ්ඩල ණය ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කරන විට එම වත්කම අයත්වන දේපල, පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, මධ්‍යස්ථානය විසින් මෝටර් රථ, යන්ත්‍ර හා පිරියත වත්කම් පන්තිය සම්පූර්ණයෙන්ම ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මුදලින් ලද ගණුදෙනු පමණක් අදාල කරගත යුතු වුවද ඊට පටහැනි ලෙස මධ්‍යස්ථානයට රජයෙන් ප්‍රදාන ලෙස ලද රු.9,500,000 ක් වටිනා මෝටර් රථය, මුදල් ලැබීම් ලෙස සලකා මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය යටතේද ස්ථාවර වත්කම් මිලදී ගැනීම් ලෙස ආයෝජන ක්‍රියාකාරකම් යටතේද දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානය විසින් මුදල් හා මුදල් සමාන දෑ හි දැක්විය යුතු රු.31,400,000 ක් වූ සත්දින ඒක්ෂණ තැන්පතු ජංගම වත්කම් යටතේ මාස 03 කට වඩා වැඩි තැන්පත් ලෙස දක්වා තිබුණි.

(ආ) 2010 වර්ෂයේදී රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදලේ තැන්පත් කර ඇති රු.8,994,089 ක තැන්පත් වලට අදාල සමාලෝචිත වර්ෂය දක්වා වූ පොළිය රු.2,139,720 ක් තැන්පතු වටිනාකමට එකතු වී තිබූ නමුත් එය තවදුරටත් ලැබිය යුතු පොළිය ලෙස දක්වා තිබුණි.

(ඇ) සී.එන්.සී මිලින් යන්ත්‍රයට උපාංග සවි කිරීම වෙනුවෙන් දරන ලද රු.4,206,758 ක් වූ ප්‍රාග්ධන ස්වරූප වියදම අළුත්වැඩියා වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2009-2011 කාල පරිච්ඡේදය තුලදී මධ්‍යස්ථානයට ලැබුණු විදුලි පහන් නියැදි 85 ක් සඳහා ඉන්වොයිස් නිකුත් කිරීමකින් තොරව පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම හේතුවෙන් රු.525,506 ක පරීක්ෂණ ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන විටද අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ක්ෂය කළ නොහැකි වත්කම් සේ හඳුනාගත හැකි කෞතුකාගාර භාණ්ඩ සියයට 15 බැගින් ක්ෂය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ක්ෂයවීම් රු.656,261 ක් හා පෙර වර්ෂවල සමුච්චිත ක්ෂය ප්‍රමාණය රු.654,185 ක් විය.

(ඊ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන පිරිවැය රු.1,071,929,562 ක් වන ස්ථාවර වත්කම් තුල රු.2.930,950 ක පාරිභෝගික ද්‍රව්‍ය ඇතුළත් කර තිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ගිණුම් 17 කින් සමන්විත වී තිබූ රු.2,936,827 ක් වූ ශේෂය තුල වර්ෂ 1 සිට වර්ෂ 3 අතර වූ ණයගැති ශේෂය රු.507,983 ක් හා වර්ෂ 9ට වැඩි ණයගැති ශේෂය රු.637,056 ක් විය.

(ආ) වෙළෙඳ ණයහිමි ශේෂය තුල රු.252,160 ක් වර්ෂ 06කට වැඩි කාලයක්ද, රු.198,812 ක් වර්ෂ 02කට වැඩි කාලයක්ද නිරවුල් කර නොතිබුණි.

(ඇ) 2005 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් මධ්‍යස්ථානයට අයවිය යුතු එකතු කල අගය මත බදු මුදල් රු.29,316,666 ක් හා රඳවා ගැනීමේ බදු මුදල් රු.239,092 ක් සමාලෝචිත වර්ෂය තුලදී ද අයකර ගෙන නොතිබුණි.

**2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8(ii) වගන්තිය, 2004 ජුනි 29 දිනැති අංක පීඊඩී 25 හා 2006 ජුනි 27 දිනැති අංක පීඑෆ්/පීඊ/9 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මුදල් අමාත්‍යවරයාගේ හා අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය නොමැතිව රු.77,000,000 ක මුදලක් රාජ්‍ය බැංකුවක සත්දින ඒක්ෂණ තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ආ) 2009 නොවැම්බර් 13 දිනැති අංක 438(2) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මධ්‍යස්ථානයේ ස්ථාවර වත්කම් භෞතිකව පරීක්ෂාකර ඉන්වෙන්ට්‍රි ලේඛනය අනුව ශේෂය, භෞතික ශේෂය, අතිරික්තය, ඌනතාවය ඇතුලත් සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද, පිරිවැය රු.1,071,929,562 ක්වූ ස්ථාවර වත්කම් සම්බන්ධව විගණනයට ඉදිරිපත් කර තිබුණේ භාණ්ඩ ඌනතාවය, හානි වූ තොග ඇතුලත් වාර්තාවක් පමණි. |

| | |
|---|---|
| (ඇ) 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(අ) වගන්තිය | සැලසුම් නිර්මාණ හා උපදේශන සේවා අංශයේ සී.එන්.සී මිලින් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් දේශීය සමාගමකට රු.1,544,880 ක් ද විදේශීය සමාගමකට රු.2,661,878 ක්ද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ගෙවා ඇතත් විධිමත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. |
| (ඇ) 2010 සැප්තැම්බර් 06 දිනැති ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ අතිරේක 19 හි 9:3:1 (අ) වගන්තිය | උපකරණ හා මෝටර් වාහන අළුත්වැඩියා සඳහා රු.200,000 කට වැඩි වියදම් සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද වාහන දෙකක් වෙනුවෙන් දරන ලද රු. 2,402,660 ක අළුත්වැඩියාවන් සඳහා එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් මත සමාලෝචිත වර්ෂයේදී රු.9,050,398 ක් ද, 2012 හා 2013 වර්ෂවල දී රු. 7,972,532 ක් ද දිරි දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කලමනාකරණ සේවා චක්‍රලේඛ අනුව පර්යේෂණ ආරම්භ කළ දින සිට මාස 06 ක් තුල එකී යෝජනාවට අදාල ක්‍රියාකාරි සැලැස්මට අනුව ප්‍රගතිය ඇතුලත් අන්තර් පර්යේෂණ වාර්තාවක් පර්යේෂණ කලමනාකරණය සඳහා වන කමිටුවට ඉදිරිපත් කර පර්යේෂණ දීමනා ගෙවීමට අනුමැතිය ලබා ගතයුතු වුවත් එකී අනුමැතියකින් තොරව 2014 ජුලි සිට 2015 අප්‍රේල් දක්වා මධ්‍යස්ථානයේ නිලධාරීන් 03 දෙනෙකුට පර්යේෂණ දීමනා ලෙස රු.464,126 ක් ගෙවා තිබුණි.

(ඇ) සත්දින ඒක්ෂණ තැන්පතුවල තැන්පත් කර තිබූ රු.4,500,000 ක මුදලක් කාර්ය මණ්ඩලයට ණය ලබාදීම සඳහා යොදවා තිබුණු අතර ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ඈ) වාණිජ ව්‍යාපෘති ලාභය උපයෝගී කර ගනිමින් මධ්‍යස්ථානයේ ඉංජිනේරුවරුන්ට මෝටර් රථ මිලදී ගැනීම සඳහා රු.1,000,000 ක ණය මුදලක් සියයට 4.2 ක වාර්ෂික පොලි පදනමක් මත ලබාදීමේ යෝජනා ක්‍රමයක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි. මෙලෙස විධිමත් අනුමැතියකින් තොරව ඉංජිනේරුවන් 06 දෙනෙකුට රු.6,000,000 ක් ලබාදී තිබූ අතර රජයේ මෝටර් රථ තීරුබදු සහන ලබාගත් නිලධාරීන් 04 දෙනෙකුද, මෙම ණය මුදල් ලබාගෙන තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.19,383,328 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.28,114,859 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,731,531 ක වර්ධනයක් දක්නට ලැබුණි. මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය සඳහා පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් සියයට 27 කින් වර්ධනය වීමත්, වෙනත් මෙහෙයුම් වියදම් සියයට 56 කින් අඩුවීමත් ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී පර්යේෂණ හා සංවර්ධන වියදම් වෙනුවෙන් රු. 18,138,000 ක් දැරීමට සැලසුම් කළද දරා තිබුණේ රු.8,317,497 ක් වන අතර එය වර්ෂයේ මුළු වියදමෙන් සියයට 3කි. එසේම පෙර වර්ෂයට සාපේක්ෂව පර්යේෂණ හා සංවර්ධන වියදම් සියයට 29 කින් අඩු වී තිබුණි. පර්යේෂණ හා සංවර්ධනය සම්බන්ධ කාර්යයන් සිදු කිරීම මධ්‍යස්ථානයේ මූලික කාර්යයක් වුවද පසුගිය වර්ෂ කීපයක සිට පර්යේෂණ හා සංවර්ධන වියදම් සීඝ්‍රයෙන් අඩුවී තිබුණු අතර මුළු වියදමෙන් පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා දරා තිබුණේ ඉතා අඩු මුදලකි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල විවිධ අංශවල කාර්යසාධනය ක්‍රියාකාරී සැලැස්ම සමඟ පරීක්ෂා කිරීමේදී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සැලසුම් නිර්මාණ හා උපදේශන සේවා අංශය මගින් විවිධ ඩයි හා අච්චු නිර්මාණය කිරීමේ සේවා සැපයීමේ වැඩ ඇණවුම් 120 ක් ඉටු කිරීමෙන් රු.6,500,000 ක ආදායමක් ඉපයීමට සැලසුම් කළද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සේවා 48 ක් පමණක් සපයා රු.1,561,000 ක ආදායමක් උපයා තිබුණි. මෙම අංශයේ භාවිතා කරනු ලබන සි.එන්.සි මිලින් යන්ත්‍රය ක්‍රියාවිරහිත තත්ත්වයේ පැවතීම හේතුවෙන් භාරගනු ලබන ඇණවුම් සීඝ්‍ර ලෙස අඩුවී තිබුණි.

(ii) ඉහත අංශය මගින් සමාලෝචිත වර්ෂය තුලදී ස්වයංක්‍රීයව ක්‍රියාකරන මැණික් කපන යන්ත්‍රයක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළද ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

(iii) ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා උපදේශන සේවා සැපයීමෙන් වර්ෂය තුලදී රු.3,300,000 ක ආදායමක් ඉපැයීමට සැලසුම් කළද, වර්ෂය අවසාන වනවිට උපයා තිබුණේ රු.600,000 ක ආදායමක් පමණි.

(iv) "Flap Gates" ව්‍යාපෘතියෙන් රු.600,000 ක ආදායමක් උපයා ගැනීමට සැලසුම් කළද සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ආදායම් ලැබී නොතිබුණි.

(v) මධ්‍යස්ථානයේ තාක්ෂණය භාවිතා කරමින් ඉදිකරනු ලබන අඩු වියදම් ඉදිකිරීම් රාජ්‍ය අංශයේ ඉදිකිරීම් සඳහා හඳුන්වාදීමේ අරමුණෙන් ආරම්භ කළ ව්‍යාපෘතීන් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.1,000,000ක ආදායමක් ලබා ගැනීමට අපේක්ෂා කළද අපේක්ෂිත ආදායම් ලැබී නොතිබුණ අතර රු.619,051 ක වියදම් දරා තිබුණි.

(vi) සමාලෝචිත වර්ෂය තුලදී ආදාහනාගාරයක් ඉදිකිරීමේ වාණිජ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමෙන් රු.5,500,000ක ආදායමක් ඉපැයීමට අපේක්ෂා කළද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබීම නිසා අපේක්ෂිත ආදායම් ලැබී නොතිබුණි.

(vii) හම්බන්තොට හා පුත්තලම් දිස්ත්‍රික්කවල පුස්තකාල ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා උපදේශන සේවා සැපයීමට සැලසුම් කළද ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

(viii) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට තාක්ෂණ අලෙවි අංශයේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟා නොවුනු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ඉලක්කය | තත්‍ය කාර්ය සාධනය |
| --- | --- |
| i. තාක්ෂණ පැවරුම් බලපත්‍ර 62 ක් නිකුත් කිරීමෙන් රු.732,000 ක ආදායමක් ඉපැයීම. | තාක්ෂණ පැවරුම් බලපත්‍ර 21 ක් පමණක් නිකුත් කර රු.139,000ක ආදායමක් උපයා තිබුණි. |
| ii. පර්යේෂණ පත්‍රිකා 17 ක් ප්‍රසිද්ධ කිරීම. | පර්යේෂණ පත්‍රිකා 2ක් පමණක් ප්‍රසිද්ධ කර තිබුණි. |
| iii. බුද්ධිමය දේපල ප්‍රතිපත්තියක් සකස් කිරීම. | 2013 වර්ෂයේදී ආරම්භ කර තිබුනද සමාලෝචිත වර්ෂයේදී සකස් කර අවසන් කර නොතිබුණි. |

(ix) නර්ඩ් මධ්‍යස්ථානය විසින් පුහුණු වැඩසටහන් 22 ක් පැවැත්වීමෙන් රු.1,900,000 ක ආදායමක් ඉපයීමට අපේක්ෂා කළද පුහුණු වැඩසටහන් 14 ක් පවත්වා රු.868,538ක ආදායමක් පමණක් උපයා තිබුණි.

(x) ISO 9001 පද්ධති සහතික ක්‍රමය නර්ඩ් මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර 2011 සිට 2014 දක්වා වර්ෂවල ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

මීගමුව නගර සභාව සඳහා මළ අපහරණ පද්ධතියක් මධ්‍යස්ථානය විසින් ඉදිකර නගර සභාවට භාරදී තිබුණද මළ අපහරණ පද්ධතිය ක්‍රියාත්මක නොවීම හේතු කොටගෙන නර්ඩ් මධ්‍යස්ථානයට ලැබිය යුතු ඉතිරි මුදල වන රු. 2,128,636 ක මුදල ලබාදීම නගර සභාව ප්‍රතික්ෂේප කර තිබුණි. එම මුදල සමාලෝචිත වර්ෂයේදී ගිණුම්වලින් ලියාහැර තිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවාදායක ආයතන වෙත වාර්තා නිකුත් කිරීම ප්‍රමාද කිරීම නිසා පසුගිය වර්ෂවලදී ලැබු වැඩ ඇණවුම් අඩුවීම හේතුවෙන් මධ්‍යස්ථානයේ ආනයනික බැටරි පරීක්ෂා කිරීමේ වාණිජ ව්‍යාපෘතියෙන් ලද ආදායම සීඝ්‍රයෙන් අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මෙම ව්‍යාපෘතියෙන් ලැබු ආදායම රු.14,918ක් වූ අතර ආනයනික බැටරි පරීක්ෂා කිරීම සඳහා රු.11,949,980කට මිලදී ගෙන තිබු බැටරි ටෙස්ටරය හා අනෙකුත් යන්ත්‍ර උපකරණ ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) 2011 වර්ෂයේ දී මධ්‍යස්ථානයට රු.1,049,369ක් වටිනා විදුලි පහන් 83ක් නියැදි පරීක්ෂා කිරීම සඳහා භාර දී තිබුණද 2014 දෙසැම්බර් වන විටද නියැදි පරීක්ෂා සිදුකර නොතිබුණි.

(ඇ) මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ එකතුව රු.9,071,303 ක් පිරිවැය වු පර්යේෂණ ව්‍යාපෘති 10කට අදාල පර්යේෂණ වැඩකටයුතු අවසන් වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) මධ්‍යස්ථානය සතු තාක්ෂණය පැවරීම හා බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අවුරුදු 05 ක කාල පරිච්ඡේදය තුල හඳුන්වා දී ඇති තාක්ෂණ හා තාක්ෂණ උපකරණ සංඛ්‍යාව 19 ක් වන අතර 2010, 2011 වර්ෂවල හඳුන්වා දුන් තාක්ෂණ උපකරණ 03ක් සඳහා පමණක් තාක්ෂණ පැවරීම් සිදුකර තිබුණි.

(ii) මධ්‍යස්ථානය හඳුන්වාදුන් තාක්ෂණ උපකරණ 49 සඳහා ලියාපදිංචි බලපත්‍ර ලාභීන් 898 දෙනෙකු වූ අතර, ඉන් 2014 වර්ෂයේ දී බලපත්‍ර අළුත් කර තිබුණේ බලපත්‍ර ලාභීන් 83 දෙනෙකු පමණක් වන අතර තාක්ෂණික උපකරණ 30ක් සඳහා බලපත්‍ර ලබාගෙන ඇති බලපත්‍ර ලාභීන් 299 දෙනෙකු බලපත්‍ර අළුත් කිරීම සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණි.

(iii) පිරිමැසුම්දායක ගොඩනැගිලි ඉදි කිරීම සඳහා ලියපදිංචි වී ඇති බලපත්‍රලාභී 398 දෙනෙකු හා පෙරසවි අංගන ලාභීන් 35 දෙනෙකු 2005ට පෙර ලියාපදිංචි වූවන් වන අතර තාක්ෂණය යල් පැනීම හා මෑත කාලයට ගැලපෙන ලෙස නර්ඩ් තාක්ෂණය නවීකරණය නොවීම හේතුවෙන් බලපත්‍රලාභීන් බලපත්‍ර අළුත් කර නොතිබුණි.

(ඉ) 2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනතේ xiv 83(2) වගන්තියට අනුව පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කල දින සිට දෙවන අවුරුද්ද ඉකුත් වූ විට එය බලාත්මකව තබා ගැනීමට නම් දෙවන අවුරුද්ද සහ පේටන්ට් බලපත්‍ර වලංගු කාලසීමාව ඇතුලත වූ එක් එක් අනුප්‍රාප්තික අවුරුද්ද ඉකුත්වන දිනයට මාස 12කට පෙර නියමිත වාර්ෂික ගාස්තු ගෙවා පේටන්ට් බලපත්‍ර අළුත් කල යුතුය. එසේ වුවද 2014 වර්ෂය දක්වා බලපත්‍ර 28ක් අළුත් කර නොතිබුණු අතර නව තාක්ෂණ උපකරණ වෙනුවන් පේටන්ට් අයිතිය ලබාගැනීම සඳහා 2002 වර්ෂයේ සිට අයදුම්පත් 07 ක් ඉදිරිපත් කලද 2014 අවසාන වන විටද පේටන්ට් අයිතිය ලබාගෙන නොතිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානයට අයත් ප්‍රධාන තොග ගබඩාවේ රු.1,097,383 ක් වූ නිකුත් නොවන තොග අයිතම 95 ක් හා රු.52,104 ක් වූ හානි වූ තොග අයිතම 08 ක් වර්ෂ 14කට අධික කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) මධ්‍යස්ථානයේ එක් එක් අංශ සඳහා මිලදීගෙන ඇති රු.45,971,236ක් වටිනා යන්ත්‍ර හා උපකරණ වර්ෂ 3-8 දක්වා කාලයක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) මධ්‍යස්ථානයේ තාක්ෂණය භාවිතා කරමින් නිවසක් ඉදිකිරීමේ දී සත්‍ය වශයෙන් කොපමණ මුදලක් වැය වන්නේ ද යන්න පරීක්ෂා කර බැලීමේ අරමුණින් රු. 3,710,425 ක් වැය කරමින් 2013 වර්ෂයේදී මධ්‍යස්ථානයේ තාක්ෂණ උද්‍යානය තුල ආදර්ශ නිවසක් ඉදිකර ඇති අතර එම නිවස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.5 හඳුනාගන්නා ලද පාඩු**

මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කළ වාණිජ ව්‍යාපෘති 02කින් ව්‍යාපෘති ආදායම ඉක්මවා වියදම් දරා තිබූ බැවින් මධ්‍යස්ථානයට රු.609,726 ක අලාභයක් සිදුවී තිබුණි.

**4.6 කොන්ත්‍රාත් පරිපාලනය**

පොලොන්නරුව මහ රෝහල සඳහා හෙද නේවාසිකාගාරයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් රු.22,520,010ක මුදලකට මධ්‍යස්ථානයට පවරා තිබුණි. ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඉදිකිරීම් කටයුතු 2011 මාර්තු 15 ආරම්භ වී 2011 ජූලි 15 අවසන් වීමට නියමිතව තිබුණ ද ඉදිකිරීම් කටයුතු අවසන් වී තිබුණේ 2013 පෙබරවාරි 02 දිනය.

(ආ) මධ්‍යස්ථානය විසින් නැවත ඉදිකිරීම් සැලැස්ම වෙනස්කර රු.24,293,400ක මුදලකට ඇස්තමේන්තු සකස්කර ඒ අනුව ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණු අතර එලෙස වෙනස් කල ඇස්තමේන්තුව තාක්ෂණ ඇගයීම් කමිටුව මගින් අනුමත නොකිරීම නිසා ගිවිසුම් අත්සන් කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2013 ජනවාරි 18 දින රු.29,450,947ක් වූ බිල්පත් අංක 07 සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබූ අතර ඒ සඳහා රු.20,274,560ක මුදලක් ලැබී තිබුණි. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් රු.9,176,387 ක් අයවිය යුතු වුවත් 2015 ජුනි 30 විගණිත දින වන විටද එම මුදල් අයකර ගෙන නොතිබුණු අතර අවසන් බිල්පත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

2014 පෙබරවාරි 02 දින වන විට නඩත්තු කාල සීමාව අවසන් වී තිබුණ ද අඩුපාඩු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් රු. 1,214,670 ක් වූ රඳවා ගැනීම් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

බිල්පත් අංක 07ට අනුව අතිරේක වැඩ (Extra works) රු.2,984,169ක් ද මිල විචලනයන් (Price Fluctuation) රු.2,047,560ක් ද වූ අතර ඒ සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලැබී නොතිබුණි.

**4.7 ප්‍රමාද වූ ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) <u>ජීව ඉන්ධන උෂ්ණත්ව පාලකය සහිත බේකරි උඳුනක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය</u>**

2012 ජනවාරි 09 ආරම්භ කළ ජීව ඉන්ධන භාවිතා කර බේකරි උඳුනක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය 2012 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට නියමිතව තිබූ අතර ඇස්තමේන්තුගත පිරිවැය රු. 400,000ක් විය. අදාල කාල පරිච්ඡේදය තුල ව්‍යාපෘතිය අවසන් කිරීමට අපොහොසත් වී තිබූ අතර, 2014 ඔක්තෝබර් වන විට අවස්ථා කිහිපයක දී එකතුව රු. 6,366,000ක අතිරේක ප්‍රතිපාදන අනුමත කරගෙන තිබුණි. එය මූලික ඇස්තමේන්තුගත පිරිවැය මෙන් 16 ගුණයකි. මෙම ව්‍යාපෘතිය 2014 ඔක්තෝබර් 31 දින වන විට නිම කිරීමට නියමිතව තිබූ අතර 2014 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු. 3,496,796ක් වැයකර තිබුණ ද ව්‍යාපෘතිය මෙතෙක් අවසන් කර නොතිබුණි.

**(ආ) <u>රොබෝ යන්ත්‍රයක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය</u>**

රොබෝ යන්ත්‍රයක් නිර්මාණය කිරීමේ අරමුණින් ආරම්භ කළ ව්‍යාපෘතිය සඳහා මොරටුව විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ මොරටුව විශ්වවිද්‍යාලයට රු.1,132,471ක මුදලක් ලබාදී තිබුණි. 2012 ජනවාරි මාසයේ දී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය 2013 ජනවාරි අවසන් වීමට නියමිතව තිබුණද ව්‍යාපෘතිය නිම කිරීම 2013 දෙසැම්බර් නිමකර තිබූ නමුදු රොබෝ යන්ත්‍රය අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කළ නොහැකි වී තිබුණි.

**4.8 අක්‍රීය ව්‍යාපෘති**

සමාලෝචිත වර්ෂයේ දී ආරම්භ වී එම වර්ෂය තුලදීම අවසන් වීමට නියමිතව තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු. 6,785,000ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 07කට අදාලව ප්‍රගතියක් නිරීක්ෂණය නොවීය. මෙම ව්‍යාපෘති නියමිත දිනට අවසන් කර නොතිබීම නිසා ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබූ අතර ඇතැම් ව්‍යාපෘති වල කාලසීමාව ඉක්මගොස් තිබූ අතර කාලය දීර්ඝ කරගෙන හෝ නොතිබුණි.

**4.9 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කළ කාර්ය මණ්ඩලය 311ක් වූ අතර 2014 දෙසැම්බර් 31 දින වනවිට විධායක හා විධායක නොවන තනතුරු වල පුරප්පාඩු 65ක් ද, විධායක තනතුරුවල අතිරික්තතා 15ක් ද පැවතිණි.

(ආ) අනුමත බඳවා ගැනීමේ පරිපාටියෙන් බැහැරව කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවාගත් අවස්ථා නිරීක්ෂණය විය.

(i) බඳවා ගැනීමේ පරිපාටියට අනුව "අධ්‍යක්ෂක (මානව සම්පත් සංවර්ධන)" තනතුර සඳහා අවුරුදු 15ක පලපුරුද්දක් අවශ්‍ය වුවත්, එසේ නොමැති නිලධාරිනියක් අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ නොමැති "කළමනාකරු (මානව සම්පත්)" ලෙස 2014 අගෝස්තු 01 දින සිට අවුරුදු 01ක කාලසීමාවක් සඳහා බඳවාගෙන තිබුණි.

(ii) "යන්ත්‍ර ශිල්පී" තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටියට පටහැනිව කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු බඳවා ගෙන 2014 මැයි සිට මාසිකව රු. 22,971 බැගින් දීමනා ගෙවා තිබූ අතර බඳවා ගැනීමේ පරිපාටියට පටහැනිව අදාල ක්ෂේත්‍රයේ අවුරුදු 01ක පලපුරුද්දක් නොමැති නිලධාරීන් 05 දෙනෙකු බඳවා ගෙන මාසික දීමනා හා අර්ථසාධක දීමනා ලෙස 2013 වර්ෂයේදී රු. 170,626 ක් ද සමාලෝචිත වර්ෂයේ දී රු. 283,723 ක් ද ගෙවා තිබුණි.

(iii) අනුමත කාර්යමණ්ඩලය ඉක්මවා නිලධාරියෙකු 2014 ජුනි 19 සිට අවුරුදු 01 කාල සීමාවකට කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සමාලෝචිත වර්ෂයේ දී රු.167,358ක් දීමනා හා සේවක අර්ථසාධක ලෙස ගෙවා තිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මධ්‍යස්ථානයේ සභාපති වෙත යොමු කරන ලදි. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමුවිය යුතුය.

(අ) ව්‍යාපෘතිය පිරිවැයකරණය හා කළමනාකරණය
(ආ) ණයගැතියෝ
(ඇ) වාහන පාලනය